# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1624 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 25/12/ 2023 පැය 2135

## මාධ්‍ය නිවේදනය

**තලම්මැහැර ශ්‍රී සුනන්දාරාමය පුරාණ විහාරස්ථානයේ සංඝමිත්තා පෙරහර හේතුවෙන් රථ වාහන ගමනා ගමනය සීමා කිරීම - පන්නල පොලිස් වසම.**

පන්නල පොලිස් වසමේ තලම්මැහැර ශ්‍රී සුනන්දාරාමය පුරාණ විහාරස්ථානය මගින් වාර්ෂිකව පවත්වනු ලබන ඓතිහාසික සංඝමිත්තා පෙරහර 2023.12.26 වන දින රාත්‍රී 0700 සිට රාත්‍රී 1100 දක්වා පැවැත්වීමට නියමිතය.

පෙරහර පැවැත්වෙන රාත්‍රී 0700 සිට රාත්‍රී 0800 දක්වා පන්නල කුලියාපිටිය ප්‍රධාන මාර්ගයේ ගලයාය හන්දිය අසල සිට පන්නල නගරය දක්වාද, රාත්‍රී 0800 සිට රාත්‍රී 1100 දක්වා පන්නල ගිරිඋල්ල ප්‍රධාන මාර්යේ පන්නල නගරයේ සිට කොටුවැල්ල බුදු පිළිමය හන්දිය දක්වා ද රථ වාහන ගමනා ගමනය සීමා කිරීමට කටයුතු කරනු ඇත.

එබැවින් එම කාල සීමාව තුල පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට ඉහත මාර්ග භාවිතා කිරීමට අපේක්ෂිත රියදුරුන්ගෙන් හා මහජනතාවගෙන් පොලිසිය ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග :-**

- කුලියාපිටිය දෙස සිට පන්නල දෙසට ධාවනය කරන රථ වාහන ගලයාය හන්දියෙන් දකුණට ඇති මාර්ගයේ පන්නල නගරය දක්වා ගමන් කල හැක.
- ගිරිඋල්ල දෙස සිට පන්නල දෙසට ගමන් කරන රථ වාහන කොටුවැල්ල හන්දියෙන් දකුණට ඇති මාර්ගය ඔස්සේ බෙනවත්ත හන්දියට ගමන් කර පන්නල නගරය දක්වා ගමන් කල හැක.
- දංකොටුව දෙස සිට පන්නල දෙසට ධාවනය කරන රථ වාහන මාකඳුර හන්දියෙන් වමට ඇති එළිවිල කෝන්ගොඩ හරහා යක්විල මාර්ගයේ වේරහැර හන්දියට ගමන් කර පන්නල නගරය දක්වා ගමන් කල හැක.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**